# පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)

உள்ளூராட்சிதிணைக்களம்(மேல் மாகாணம்)

**DEPARTMENT OF LOCAL GOVERNMENT (WESTERN PROVINCE)**


**අපගේ දැක්ම :- "යහපාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්"**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனதுஇலக்கம்L<br>My No. LGD/2A/ පොදු | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | දිනය<br>திகதி<br>Date 2020.04.10 |

**ඉතා හදිසි**

**බස්නාහිර පළාතේ**
**සියලු ම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත.**

**<u>බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන තුළ අත්‍යවශ්‍ය එළවළු බෙදාහැරීම සම්බන්ධවයි.</u>**

බස්නාහිර පළාත සඳහා එළවලු හා පළතුරු ප්‍රමාණවත් පරිදි නොලැබීම නිසාත් නිෂ්පාදන අතිරික්ත පවතින ප්‍රදේශවල ගොවීන්ගෙන් මිලදීගනු ලබන එළවළු ආරක්ෂක අංශ විසින් බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත ආනයනය කොට භාරදීමට කටයුතු කරන බවත්, එම ද්‍රව්‍ය පළාත් පාලන ආයතන මැදිහත් වී මහජනතාව අතර බෙදාහැරීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙසත්, අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසුවිපරම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකා ප්‍රධානී බැසිල් රාජපක්ෂ මහතාගේ උපදෙස් මත බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අදාළ කටයුතු සිදුකරන ලෙසත් මා වෙත උපදෙස් ලබාදී ඇත.

02. මෙම එළවළුවලට අදාළ බිල්පත ඉදිරියේ දී ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන අතර සෑම කිලෝග්‍රෑම් එකකින් ම රු 5/-ක ප්‍රවාහන ගාස්තුවක් ගෙවීමට සිදුවේ. මෙම කටයුත්ත ජනතාවට සහන සැලසීම සඳහා සිදුකරන කාර්යයක් බැවින් ඒ සඳහා පරිපාලන, විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් පියවාගැනීම සඳහා භාණ්ඩ ගැනුම් පිරිවැයට උපරිම 40%ක අගයක් එකතු කර අලෙවි කළහැකිය.

03. එක් පළාත් පාලන ආයතනයක් සඳහා අවම වශයෙන් ලොරි තුනක එළවළු ප්‍රමාණයක් (එක් ලොරියක 7000Kg) ලබාදීමට නියමිත අතර, මෙම භාණ්ඩ බෙදාහැරීමේ කටයුතු සඳහා සෑම පළාත් පාලන ආයතනයක් විසින් ම ප්‍රමුඛත්වය ලබාදී ඉටුකළ යුතු අතර අද දින තුළ දී ම භාණ්ඩ මහජනතාව වෙත විධිමත් පරිදි බෙදාහැරීම සඳහා කඩිනම් වැඩපිළිවෙළක් සකස් කළයුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

කසුන් ඇපා සෙනෙවිරත්න,
පළාත් පාලන කොමසාරිස්,
බස්නාහිර පළාත.

පිටපත් -

01. ප්‍රධාන මෙහෙයුම් නිලධාරි, අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසුවිපරම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකාය. -කාරු.දැ.ගැස
02. ප්‍රධාන ලේකම් (බ.ප) -කාරු.දැ.ගැස
03. ආණ්ඩුකාර ලේකම් (බ.ප) -කාරු.දැ.ගැස
04. පළාත් පාලන ලේකම් (බ.ප) -කාරු.දැ.ගැස
05. පළාත් පාලන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර) -විමර්ශන නිලධාරීන් හා ප්‍රජා සං. නිලධාරීන් මගින් පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධීකරණය කර ප්‍රගතිය අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත වාර්තා කිරීම සඳහා


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ලිපිනය / முகவரி/Address | අංක 204, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, බත්තරමුල්ල / இல.204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுள்ள / No. 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla | | | | | | | | |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | පොදු<br>General | කොමසාරිස්<br>Commissioner | පාලන හා මානව සම්පත්<br>Admin / HR | නීති<br>Legal | සැලසුම්<br>Planning | ගිණුම්<br>Accounts | විමර්ශන<br>Investigation | ආයතන පරිපාලන<br>Establishment | ප්‍රජා සංවර්ධන<br>Community Development |
| | 2093156 | 2092570 | 2092574/2092576 | 2092572 | 2092571 | 2092573 | 2092580 | 2092582 | 2092583 |
| ෆැක්ස් / பெக்ஸ்/ Fax | 2092577 | වෙබ් ලිපිනය/ வெப்தளம்/Web | www.lgd.wpc.gov.lk | ඊමේල් /ஈமெயில்/ Email | lgd@wpc.gov.lk | | | | |